# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,816 - 2013 ජුනි මස 21 වැනි සිකුරාදා - 2013.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1560 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1565 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |



*සැ. යු.* - (i) ජයන්තිපුර සුහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ස්වාභිමානී දහම් සවිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 12 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජුනි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## ඉඩම් ආඥාපනත යටතේ ගම් පුළුල් කිරීම, නිවාස සඳහා බෙදා දීමට ඇති ඉඩම් වෙනුවෙන් ඉඩම් ලබා දීමට ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන් ගල්ගමුව, ගිරිබාව, ඇහැටුවැව, අඹන්පොල, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ වූ නිවේදනය

විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2013.10.03 සහ 04 යන දෙදින පෙ.ව. 10.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වන බව දැනුම් දෙනු ලැබේ.

- *(අ)* ඉඩමේ නම : මැදගම මූකලාන
- *(ආ)* ඉඩමේ මැනුම් විස්තර : භූ. මූ. පී. 13 හි කැබලි අංක 544න් කොටසක්
- *(ඇ)* ඉඩම පිහිටි ගම : මැදගම
- *(ඈ)* ග්‍රාම නිලධාරී කොට්ඨාසය : අංක 87 මැදගම
- *(ඉ)* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ගල්ගමුව
- *(ඊ)* දිස්ත්‍රික්කය : කුරුණෑගල
- *(උ)* අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : ගොඩ ඉඩම
- *(ඌ)* අන්සතු කරනු ලබන ඒකකය : භූ. මූ. පි. 13 හි කැබලි අංක 544න් කොටසක්.

ගල්ගමුව, ගිරිබාව, ඇහැටුවැව, අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචි පහත දැක්වෙන පංතියට හෝ පංතිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ :-

ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවකයින් ;
ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ යෙදී සිට ක්‍රියාන්විතයේ දී ආබාධිත වූවන් ;
ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ යෙදී සිට ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය හා අතුරුදහන් වූවන්ගේ -

- *(අ)* විවාහක නම් කලත්‍රයා හෝ අවිවාහක දරුවන්,
- *(ආ)* අවිවාහක නම් මව හෝ පියා.

ඉල්ලුම්කරුවන් සතුව වෙනත් ඉඩම් නොතිබිය යුතු යි.

ඉහත සඳහන් පංතියට හෝ පංතිවලට තමන් අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු යි.

සියලුම ඉල්ලුම්පත්‍ර 2013.08.30 දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව" වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2013.10.03 සහ 04 දෙදින පෙ.ව. 10.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම ලැබීම සඳහා සලකා බැලීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ දී අවසර පත්‍රයක් ලැබෙන අතර එය එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද එම ඉඩම වෙනුවෙන් අක්කරයකට රුපියල් 40,000 බැගින් ගණන් බලනු ලබන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මුදලට හිලව් කරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තාගෙන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබා ගත හැකි ය :-

(i) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) - පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල

(ii) ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව.

————,
පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ).

2013 මැයි මස 27 වැනි දින.

* ඉල්ලුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය පහතින් දක්වා ඇත.

රජයේ ඉඩම් ආඥාපනත යටතේ ගම් පුළුල් කිරීම, නිවාස සඳහා බෙදාදීමට ඇති ඉඩම් වෙනුවෙන් ඉඩම් ලබාදීමට ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන් ගල්ගමුව, ගිරිබාව, ඇහැටුවැව, අඹන්පොල, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :————.
3. (i) ලිපිනය :————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :————.
   *(අ)* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
   *(ආ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
4. ගෘහ මූලික අංකය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :————.
7. උපන් දිනය :————.
8. විවාහක/අවිවාහක ද යන වග :————.
9. රැකියාව :————.
10. රැකියාව කරන ස්ථානයේ ලිපිනය :————.
11. අයදුම්කරු/කලත්‍රයා (පුරුෂයා හා භාර්යාව) ඇතුලු මුලු පවුලේ වාර්ෂික ආදායම :

| *නම* | *අයදුම්කරුට ඇති සම්බන්ධය* | *රැකියාව* | *වාර්ෂික ආදායම* (රුපියල්) |
|---|---|---|---|
| | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර ෑ

| *ඉඩමේ නම* | *ප්‍රමාණය* | *අයිතියේ ස්වභාවය* | *හවුලේ පරවේණි ඉඩමක් නම් හවුලේ අයට හිමි කොටස්* |
|---|---|---|---|
| | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය)

13. කලත්‍රයා (පුරුෂයා/භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය සඳහන් කරන්න :————.
14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය ෑ (තමාගේ ද?/බද්දට ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග) :————.
15. නිවස පිහිටි ස්ථානය :————.
16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————.

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසලේ/විද්‍යාලයේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| 1.<br>2.<br>3. | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිළ දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :————.
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :————.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :————.

19. පවුලේ යම් සාමාජිකයෙක් මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍යයක් බව හෙළිවුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

අනු අත්සන් කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :————.
ලිපිනය :————.

06-403

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසරපත්‍ර ලැබීමට ගොවිජන පංතියට අයත් තැනැත්තන් නොවන තැනැත්තන් තෝරාගැනීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය**

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරාගැනීමට පුත්තලම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2013 අගෝස්තු මස 15 වැනි දින පෙ. ව. 10.00 ට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

- (අ) ඉඩමේ විස්තරය : 618 පුත්තලම දකුණ හා 618 ඒ තිල්අඩිය ග්‍රාම නිලධාරී වසමට අයත් පදිංචි සිටි, වගාකරන හා වාණිජ කටයුතු කරන රජයේ ඉඩම්,
- (ආ) ඉඩම පිහිටි ගම : 618 පුත්/දකුණ හා 618 තිල්අඩිය ග්‍රාම නිලධාරී වසම්වලට අදාළ නගර සීමාවට අයත් බිම් කොටස්,
- (ඇ) ග්‍රාම නිලධාරී වසම : 618 පුත්/දකුණ, 618 ඒ තිල්අඩිය,
- (ඈ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසය : පුත්තලම,
- (ඉ) දිස්ත්‍රික්කය : පුත්තලම,
- (ඊ) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය (වාරිමාර්ග පහසුකම් සලසන ලද හා/හෝ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති) : වාරිමාර්ග පහසුකම් සලසා නොමැති ගොඩ ඉඩම්,
- (උ) අන්සතු කරනු ලබන ඒකකය : i. නේවාසික කටයුතු සඳහා - පර්. 10 සිට පර්. 10 දක්වා
  ii. ව්‍යාපාරික කටයුතු සඳහා (නගර සීමාව තුළ) - පර්. 2 1/2 - 10

2. පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පහත සඳහන් පංතිවලට අයත් පුද්ගලයන්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

i. නගර සීමාව තුළ ස්ථිර වශයෙන් පදිංචිව සිට නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන අය,

ii. නගර සීමාව තුළ ව්‍යාපාරික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන අය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2013 ජූලි මස 26 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, පුත්තලම වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2013 අගෝස්තු මස 15 වැනි දින පෙ.ව. 10.00 ට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ දී අවසර පත්‍රයක් ලැබෙන අතර, එය එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

7. අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද, එම ඉඩම වෙනුවෙන් පර්චස් එකකට රුපියල් 150 ක් බැගින් ගණන් බලන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මුදලට එය හිලව් කරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඔවුන්ගේ ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල ද ලබා ගත හැක.

* සහකාර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පුත්තලම,
* ජනපද නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පුත්තලම,
* ග්‍රාම නිලධාරී 1. 618 පුත්/දකුණ - ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම.
  618 ඒ තිල්අඩිය - ග්‍රාම නිලධාරී කාර්යාලය, තිල්අඩිය.

ඉඩම් කොමසාරිස්.

2013 ජුනි මස 05 වැනි දින දී ය.

**ආදර්ශ ආකෘති පත්‍රය**

**පදිංචිවීම/ව්‍යාපාරික කටයුතු සඳහා ඉඩම් ඉල්ලීමේ ඉල්ලුම් පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————. වයස :————.
4. රැකියාව :————.
5. භාර්යාවගේ/පුරුෂයාගේ නම :————.
6. රැකියාව :————.
7. පවුලේ සංඛ්‍යාව :————. පවුලේ වාර්ෂික ආදායම :————.
8. ඉඩම් ඉල්ලන්නේ පදිංචියට ද?/ව්‍යාපාරික කටයුතුවලට ද? :————.
   ඉහත කරුණු දෙකටම ද? :————.

   (i) නිවේදනයේ සඳහන් ඉඩම් අතුරෙන් ඔබ ඉඩම් ඉල්ලන්නේ කුමන ග්‍රාම නිලධාරී වසමෙන් ද ? :————.
   (ii) එම වසමේ ස්ථිර පදිංචිකරුවෙක් ද? :————.
   (iii) එසේ නම් පදිංචි කාලය :————.
   (iv) එසේ නොවේ නම් ඔබ පදිංචි ග්‍රාම නිලධාරි වසම :————.
   (v) පදිංචි කාලය :————.

9. තමා සතු ඉඩම් පිළිබඳ විස්තරය :————.

   (i) පදිංචි නිවසේ අයිතිකරු :————.
   (ii) තමාට අයත් ගොඩ ඉඩම් :————.
   (iii) තමාට අයත් කුඹුරු ඉඩම් :————.

10. රණවිරු පවුලක සාමාජිකයෙක් නම් පහත විස්තර සපයන්න :————.

    (i) මීට පෙර රණවිරු ගම්මානයක ලැබී තිබේ ද? :————.
    (ii) ඒ කිනම් ස්ථානයකින් ද? :————.
    (iii) රණවිරු පවුලකට සම්බන්ධ නම් ඉල්ලුම්කරු තමා ද? :————.
    (iv) වෙනත් අයෙක් නම් ඥාතීත්වය :————.
    (v) ඉල්ලුම්කරු නම් :

    *(අ)* සේවයේ සිටී ද ? :————.
    *(ආ)* ආබාධිත ද ? :————.
    *(ඇ)* වැන්දඹු ද ? :————.

ඉහත සඳහන් තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. වැරදි හා අසත්‍ය තොරතුරු සපයා ඇති බව මා ඉඩම්ලාභියෙකු ලෙස තෝරා ගැනීමෙන් පසුව වුව ද හෙලිවුවහොත් මා නුසුදුස්සෙකු සේ සැලකීමට හේතු වන බව ද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

06-504

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2013**

ඉහත විභාගය සඳහා අයදුම්පත් කැඳවමින් අංක 1,809 හා 2013.05.03 දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) පළාත් සභා කොටසෙහි පළ කරන ලද දැන්වීමට අනුව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2013.06.28 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

එස්. එම්. එස්. තෙන්නකෝන්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

2013 මැයි මස 30 වැනි දින.

06-368

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.